# පිරිවෙන් අධ්‍යාපනය හා පිරිවෙන් පුස්තකාල සංකල්පයේ ආරම්භය හා විකාශය පිළිබඳ විමර්ශනයක්

**බෝපැත්තේ සෝමානන්ද හිමි**

## හැඳින්වීම

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට ම දැනුම එක්රැස් කිරීම, සංවිධානය කිරීම සහ බෙදා හැරීම සඳහා කිසියම් ස්වරූපයක පුස්තකාල පැවැති බවට සාධක ඇත. ක්‍රි. පූ. 3000 දී පමණ බැබිලෝනියාවේ නිපූර් නගරයේ සිද්ධස්ථානයක කුඩා මැටි ඵලක රාශියක් ගබඩා කර තිබූ බව සොයා ගෙන තිබේ. එය විධිමත්ව සටහන් පොත් ගබඩා කොට තැබූ ලේඛනාගාරයක් හෝ පුස්තකාලයක් බව පිළිගණු ලැබේ (ඇඳගම, 1994). ක්‍රි. පූ. 2000 පමණ කාලයේ එවැනි මැටි ඵලක රාශියක් ඊජිප්තුවේ ද තිබී සොයාගෙන ඇත. මේ අන්දමට වර්තමානය තරම් ම විධිමත් ව නොවුන ද පුරාණ ශිෂ්ටාචාරවල දී මානවයා විසින් පුස්තකාල ගොඩනංවා තිබූ බැව් මනාව පැහැදිලිය. විවිධ තොරතුරු එක් රැස් කොට ඒවා කිසියම් ක්‍රමවේදයකට සංවිධානය කරමින් ඔවුන් එම පුස්තකාල ක්‍රියාත්මක කරන ලදී. මෙසේ ආරම්භ වූ පුස්තකාල සංකල්පය වර්තමානය වන විට ඉතා දියුණු මට්ටමක පවතී. මිනිසා විසින් පුස්තකාල ගොඩනගනු ලැබූවේ, ස්වකීය රාජ්‍ය පවත්වා ගැනීම සඳහාත්, ආගමික ඇදහීම් හා විශ්වාස ආරක්ෂා කොට ප්‍රචාරය කිරීම සඳහාත්, වෙළඳ ගනුදෙනු සඳහාත්, අධ්‍යාපනය ලබාදීම සහ පරම්පරාවෙන් පරම්පරාවට ඔවුන්ගේ සංස්කෘතිය ආරක්ෂා කොට උරුම කර දීම සඳහාත් වැනි විවිධ කාර්යයන් සඳහා වාර්තාගත මූලාශ්‍රය තොරතුරු අවශ්‍ය වූ බැවිනි.

## ශ්‍රී ලංකාවේ පුස්තකාල ඉතිහාසය

ශ්‍රී ලංකාවේ පුස්තකාල ඉතිහාසය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී එය ක්‍රි. පූ. තෙවන සියවස දක්වා වූ කාලය තෙක් දිවයයි. අතීතයේ පටන් ම ශ්‍රී ලංකාවේ පුස්තකාල සේවාව ශ්‍රී ලංකාවේ සංස්කෘතිය, දේශපාලනය, ආගම ආදියට අදාළ වටිනා මූලාශ්‍රය

එක්රැස් කිරීම හා ඒවා සුරක්ෂිත කිරීම උදෙසා මුල් වී ක්‍රියාත්මක වී තිබේ. ක්‍රි. පූ. තෙවන සියවසට ප්‍රථම ප්‍රාග් බෞද්ධ යුගයේ පුස්තකාල තිබූ බවට ජීවමාන ව පිළිගත හැකි සාධක කිසිවක් හමු නොවේ. ශ්‍රී ලංකාවේ පුස්තකාල පැවති බවට ජීවමාන ව පිළිගත හැකි සාධක හමුවන්නේ මෙරට බුදුදහම හඳුන්වා දීමෙන් පසු කාල පරිච්ඡේදයෙනි. එකල ඉන්දියාවේ ද ග්‍රන්ථකරණයේ දී භාවිත කළේ පුස්කොළ පොත් පොත් බැවින් මිහිඳු හිමියන් ලංකාවට වැඩම කළ අවස්ථාවේ බුදුදහම පිළිබඳව ලියා තිබූ පොත් කිහිපයක් ගෙන එන්නට ඇති බව විශ්වාස කළ හැකිය (ඇඳගම, 1994). ඒ අනුව මිහිඳු මාහිමියන් විසින් ගෙන එන්නට ඇතැයි විශ්වාස කළ හැකි පුස්කොළ පොත් ඉතා පූජනීය තත්ත්වයෙන් කුමන හෝ ස්ථානයක තැන්පත් කොට තිබී ඇත. එසේ තැන්පත් කරන ලද ස්ථාන විධිමත් පුස්තකාල ස්වරූපය නොගන්නා ලද නමුත් පුස්තකාලයක අවිධිමත් ස්වරූපය ගන්නා ලද බව විශ්වාස කළ හැකිය. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන්නට ඇතැයි විශ්වාස කළ හැකි පාලි භාෂාවෙන් රචිත පුස්කොළ පොත් තැන්පත් කොට අවිධිමත් ලෙස ගොඩ නඟන්නට ඇතැයි සැලකිය හැකි පුස්තකාල ස්වරූපය ගන්නා ලද ආරාම හෝ ගල්ගුහා, ශ්‍රී ලංකාවේ පිරිවෙන් පුස්තකාල සේවාවේ මෙන් ම ශ්‍රී ලංකාවේ සමස්ත පුස්තකාල සේවාවේ ම මූල බීජය ලෙස සැලකිය හැකිය. එතැන් සිට වර්තමානය දක්වා ම ශ්‍රී ලංකාවේ පිරිවෙන් පුස්තකාල සේවාව, ආගමික ඇදහීම් හා විශ්වාස ආරක්ෂා කොට ප්‍රචාරය කිරීම සඳහාත්, ඓතිහාසික හා රාජ්‍ය තොරතුරු එක්රැස් කොට තැබීම සඳහාත්, අධ්‍යාපනය ලබාදීම සහ අනාගත පරපුරට ශ්‍රී ලාංකේය සංස්කෘතිය ආරක්ෂා කර උරුම කර දීම සඳහාත් අවශ්‍ය වන්නා වූ වාර්තාගත තොරතුරු හා දැනුම් මූලාශ්‍රයන් එක්රැස් කොට ආරක්ෂා කර තබන ලදී. මේ අනුව සලකා බලන කල පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ පිරිවෙන් පුස්තකාල සේවාව යනු, ශ්‍රී ලාංකීය මානව ශිෂ්ටාචාරය ගොඩනැඟීමටත්, එය දියුණු කිරීමටත්, ආරක්ෂා කිරීමටත් අත්‍යාවශ්‍ය වන සාමාජීය මෙවලමක් වූ බවයි.

**පිරිවෙන හා ආරාමික අධ්‍යාපනය**

"පිරිවෙන" යන වචනය විද්‍යමාන වන්නට වූයේ ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේ බුදුදහම හඳුන්වා දීමෙන් පසුව මෙරට ආරම්භ වූ

භික්ෂූ සමාජය මූලික කරගෙනය. මුල් කාලයේ දී බෞද්ධ ආගමික කටයුතු සඳහා තැනූ ගොඩනැගිලි අතර පිරිවෙන නමින් හැඳින්වූ කුටි විශේෂයක් විය. ඒවා භික්ෂු, භික්ෂුණී වාසය සඳහා සහ බණ භාවනා සඳහා භාවිත කර ඇත. කල්යාමේ දී උගත් භික්ෂූන් විසූ පිරිවෙන් භික්ෂූන්ට ඉගැන්වීමේ කටයුතු සඳහා යොදා ගෙන ඇත (ධර්මකීර්ති හිමි, 1992). වර්තමානයේ පිරිවෙන් යනු, විශේෂයෙන් පැවිදි අධ්‍යාපනය සඳහා වෙන් වූ එහෙත් ගිහියන්ට ද ඉගෙනීමට බාධාවක් නැති ආරාමයක පිහිටා ඇති අධ්‍යාපන කටයුතු සිදු කරනු ලබන ආයතන විශේෂයකි. එහෙත් ශාසන ඉතිහාසයේ මුල් අවධියේ "පිරිවෙන" යන වචනය භාවිත වූයේ වැට පවුරු ආදියෙන් පරික්ෂේප වූ ආවාස ගෙයක් හෝ තනි තනි ව පැවති කුටි විශේෂයක් හැඳින්වීම සඳහා ය. එය ම පසුව ශාස්ත්‍රාගමධර මහා සංඝයාගේ වාසය ද ඇතිව පඨන -පාඨන, උද්ග්‍රහණ- ධාරණ, සජ්ඣායන, වාචනා, ආචික්ඛන - දේශන, පරිපුච්ඡන, විවරණ, විභජන ක්‍රමයන්ගෙන් සංවිධිත අධ්‍යාපන කේන්ද්‍රස්ථාන බවට පරිවර්තනය විය (අධිකාරි, 2002).

මේ අනුව පිරිවෙන් පුස්තකාල සේවාවේ ඉතිහාසය පිරිවෙන් ආරම්භයක් සමඟ ම සිදු වූ බව මනාව පැහැදිලිවේ. අතීතයේ දී පිරිවෙන් ලෙස හඳුන්වන ලද්දේ නූතනයෙහි දක්නට ලැබෙන විද්‍යෝදය විද්‍යාලංකාර පිරිවෙන් වැනි ආයතන නොවේ. සාරත්ථදීපනී විනය ටීකාවෙහි පිරිවෙන් යන්න මෙසේ හඳුන්වා ඇත. "පරිවෙණන්ති මහාවිහාරස්ස අබ්භන්තරෙ විසුං විසුං පාකාරාදිපරිච්ඡින්නට්ඨානං" (සාරත්ථදීපනි විනයටීකාව 1948, පි. 123) එහි සඳහන් වන පරිදි පිරිවෙන නම්, විහාරය තුළ ප්‍රාකාරයෙන් වට කරන ලදුව වෙන වෙන ම භික්ෂූන් වසන තැන ය. විමති විනෝදනී විනය ටීකාවෙහි පිරිවෙන යන්න හඳුන්වා ඇත්තේ ද එසේම ය. මේ අනුව භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කරන ආරාමය, ප්‍රදේශය යන අර්ථයෙන් පුරාතනයෙහි පිරිවෙන හඳුන්වා ඇති බැව් පෙනේ. පුරාතනයෙහි භික්ෂූන්ගේ වාසස්ථානය යන අර්ථයෙන් පිරිවෙන යන වචනය භාවිත කළ නමුදු පසුකාලයේ භික්ෂූන් වහන්සේලාගේ විද්‍යාස්ථානය හෙවත් අධ්‍යාපනික මධ්‍යස්ථානය පිරිවෙන යැයි ව්‍යවහාර කරන ලදී. මේ අනුව මුල් යුගයේ පිරිවෙන නමින් හැඳින්වූයේ ආරාමයන් වන බවත්, පසුකාලීනව පිරිවෙන යන්න ලිවීම්, කියවීම, බණ පොත් වනපොත් කිරීම්, සජ්ඣායනා කිරීම් ආදිය සිදු කරනු ලබන අධ්‍යාපනික ආයතන

හැඳින්වීම සඳහා යොදා ගෙන ඇති බවක් පැහැදිලි වේ. ථෙරවාදී, මහායාන ආදී අධ්‍යාපනික සම්ප්‍රදායන්ට අයත් පිරිවෙන් නමින් හඳුන්වන ලද අධ්‍යාපන ආයතන ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ දී පමණ මහාවිහාරය ආරම්භ වීමෙන් හා ක්‍රිස්තු පූර්ව පළමුවෙනි සියවසේ දී අභයගිරිය ආරම්භ වීමෙන් ඇරඹුණි. එම විහාරාරාම සංකීර්ණය පදනම් කොටගෙන ගොඩනැගුණු පොත් එකතුව ඇසුරෙන් පිරිවෙන් පුස්තකාල යන සංකල්පයේ මූලික ආකෘතීන් බිහි වී තිබේ. මහාවිහාරය හා අභයගිරිය පදනම් කොටගෙන ඇරැඹි පිරිවෙන් පුස්තකාල ආරම්භයේ දී ''පොත්ගුල'' යන නාමයෙන් හඳුන්වා ඇත. පොත් තැන්පත් කරන ලද ගෘහය යන අරුතෙන් පොත්ගුල යන වචනය නිර්මාණය වී තිබේ.

## අනුරාධපුර යුගයේ පිරිවෙන් අධ්‍යාපන ආයතන හා තදනුබද්ධ පුස්තකාල

### මහා විහාරය සම්ප්‍රදාය

ශ්‍රී ලංකාවේ බිහි වූ පළමු අධ්‍යාපනික ආයතනය මහා විහාරය යි. මෙරට ඉතිහාසය තුළ අධ්‍යාපනික ආයතන පිළිබඳව හමුවන ජීවමාන සාධක අනුව ඉපැරැණි ම හා අග්‍රගන්‍ය අධ්‍යාපන ආයතනය මහා විහාරය වේ. බුදුදහම හඳුන්වා දුන් යුගය පටන් ක්‍රිස්තු පූර්ව පළමුවෙනි සියවස දක්වා සියවස් දෙකක පමණ කාලයක් ථෙරවාදී බුදුදහමේ මධ්‍යස්ථානය මෙන් ම ප්‍රධාන බෞද්ධ අධ්‍යාපන ආයතනය වූයේ ද මහා විහාරය යි. මහින්දාගමනයෙන් සියවස් දෙකකට පසුව මෙරට අතවත් අධ්‍යාපන ආයතන කිහිපයක් බිහි වුව ද සියවස් දොළහක පමණ කාලයක් ථෙරවාදී බුදුදහම ශාස්ත්‍රෝන්නතිය උදෙසා මහඟු සේවාවක් මහා විහාරයෙන් ඉටු කරන ලදී. මහා විහාරය ඉතා සංවිධානාත්මක අධ්‍යාපන ආයතනයක් වූ අතර එයට සම්බන්ධ අධ්‍යාපනික ආයතන ගණනාවක් දිවයින පුරා ම ක්‍රියාත්මකව තිබූ බව ජීවමාන සාධක හමුවේ. අනුරාධපුර රාජධානියෙහි රජකල මහසෙන් රජ දවස මහා විහාරයට සම්බන්ධ 364ක් වූ පිරිවෙන් විනාශ කර දමන ලද පුවතින් ද සනාථ වන්නේ මහා විහාරය හා සබැඳි අධ්‍යාපන ආයතන බොහෝමයක් තිබූ බව ය. මෙම පිරිවෙන් අතුරින් කාලප්‍රසාද පිරිවෙන, මොණර පා පිරිවෙන, සුනාහිත පිරිවෙන, මහානාම හිමි වැඩ

සිටි දික්සඳ සෙනෙවි පිරිවෙන හා බුද්ධඝෝෂ හිමි වැඩ සිටි දූරසංකර ග්‍රන්ථාකර පිරිවෙන ඉතා වැදගත් අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස පැවති බවට ඉතිහාසය තුළින් හඳුනාගත හැකිය. මහාවිහාරය මෙරට බිහි වූ පළමු පුස්තකාලය ලෙස ඒ පිළිබඳ ජීවමාන සාධක සොයා යාමේදී අපට පැහැදිලි වේ. "පුරාණ ලංකාවේ ආදිතම පුස්තකාලය මහාවිහාරය විය යුතු ය"(පඤ්ඤාකර හිමි, 1967). බුදු දහම හඳුන්වාදීමේ සිට මුඛ පරම්පරාවෙන් ගෙන එන ලද්දා වූ ත්‍රිපිටකය සහ හෙළ අටුවා ක්‍රිස්තු පූර්ව පළවෙනි සියවසේ දී ලේඛනගත කිරීමෙන් පසුව එම ග්‍රන්ථ සම්භාරය තැන්පත් කිරීමේ සහ ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව මත පුස්තකාල ආරම්භ වන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. එමෙන් ම එම යුගයන්හි දී මෙරට ප්‍රධාන අධ්‍යාපන ආයතනය වූ මහාවිහාරය මෙම පොත්ගුල පවත්වා ගෙන යාම සඳහා මූලිකත්වය දෙන්නට ඇත.

ත්‍රිපිටකය හා හෙළටුවා ලේඛනගත කළ මාතුල දනව්වේ පිහිටි අළුලෙනෙහි ආරම්භක ග්‍රන්ථ සම්භාරය තැන්පත් කරන්නට ඇති බව සැලකිය හැකි හෙයින් එම ස්ථානයෙහි පොත්ගුලක් තිබෙන්නට ඇති බව නිසැක ය. පළමුව ත්‍රිපිටකය රන්පත්වල ලියා එහි ගලක නිධන් කළ බව ජනප්‍රවාදයේ එන නමුත් එය පිළිගත් හැකි සාධක මෙතෙක් හමුව වී නොමැත (රණසිංහ, 2006). වලගම්බා රජ දවස සිදු වූ ත්‍රිපිටකය හා හෙළටුවා ග්‍රන්ථාරූඪ කිරීමේ කාර්යයට මූලිකත්වය දී කටයුතු කරන ලද්දේ ද මහාවිහාරික භික්ෂූන් වහන්සේලා ම ය. මහාවිහාරික භික්ෂූන් වහන්සේලාගේ මුලිකත්වයෙන් ලේඛන ගත කරන ලද ත්‍රිපිටකය හෙළටුවා ඇතුළත් ග්‍රන්ථ සම්භාරය මහාවිහාරයට අයත් වූ ථූපාරාමය, මිරිසවැටිය, ඉස්සරසමණාරාමය, වෙස්සගිරිය හා චෛතිය විහාරය යන පංච මහා ආවාසයන්හි තැන්පත් කරන්නට ඇති බව නිසැක ය (රණසිංහ, 2006). මේ අනුව සලකා බලන කල මහා විහාර පුස්තකාලය ලංකාවේ පැරණිතම සහ ඓතිහාසික වටිනාකමකින් යුත් පුස්තකාල සංකීර්ණය ලෙස හඳුනාගත හැකිය. මහාවිහාරයට අයත් වූ ථූපාරාමය, මිරිසවැටිය, ඉස්සරසමණාරාමය, වෙස්සගිරිය හා චෛතියගිරිය යන පිරිවෙන් ආරාම තුළ විසූ මහා විහාරික භික්ෂූන් විසින් ඉතිහාසය හා බුදුදහමට සම්බන්ධ පුරාවස්තු අළලා ලියනු ලැබූ දීපවංශය, වංසත්තප්පකාසිනී, මහාවංශය, ථූපවංශ, සිංහල බෝධිවංශය, දම්පියා අටුවා ගැටපදය, සිඛවළඳ හා සිඛවළඳ

විනිස ආදී කෘති මෙම පුස්තකාල තුළ තැන්පත් කොට තිබූ පොත් අතර තැන්පත් කොට තිබෙන්නට ඇත. ආගමික ග්‍රන්ථයන්ට ලියවුණු ව්‍යාඛ්‍යාන ද, මහා විහාර විෂය මාලාවට අයත් වූ රාජ්‍ය පරිපාලනය, නීතිය, ව්‍යාකරණ, සාහිත්‍යය, වෛද්‍ය ශාස්ත්‍රය, තාරකා විද්‍යාව වැනි විෂයයන් පිළිබඳ ග්‍රන්ථ ද මෙම පුස්තකාලවල තිබෙන්නට ඇත (රණසිංහ, 2006). මහාවිහාරයට සම්බන්ධව තිබූ ප්‍රධාන විහාරාරාම හා පිරිවෙන් ආයතන අතර ප්‍රධානතම පුස්තකාලය ලෙස සැලකිය හැක්කේ දූරසංකර ග්‍රන්ථාකර පිරිවෙන් පුස්තකාලය යි. "ග්‍රන්ථාකර" යන වචනයෙහි අර්ථය සලකා බැලීමේදී පොත් ආකාරයක්, පොත් ගොඩක්, පොත්ගුල වැනි අර්ථයකින් එය හඳුනාගත හැකිය. ථෙරවාදී ත්‍රිපිටකය සහ හෙළටුවාගෙන් සමන්විත වූ මහාවිහාර පොත්ගුල්වල කීර්තිය විදේශයන්ට ද පැතිරී යාමේ ප්‍රතිඵලයක් වශයෙන් එම ග්‍රන්ථ අධ්‍යයනයට මෙරට පැමිණි වියත්හු මෙම පොත් පරිශීලනය කළහ. පොත්පත් ඉතා දුර්ලභ වූ මෙම යුගයේ දී ඒවා සුරක්ෂිත කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ඒවාට ඉතා ඉහල ආරක්ෂාවක් මහාවිහාරීය භික්ෂූන් විසින් ලබාදුන් බවට සාධක හමුවේ. අටුවාකරණය සඳහා මෙරටට පැමිණි බුද්ධඝෝෂ හිමියන්ට ඒ සඳහා අවස්ථාව ලබා දී ඇත්තේ උන්වහන්සේගේ දැනුම පරීක්ෂා කිරීමෙන් අනතුරුව ය. දූරසංකර ග්‍රන්ථාකර පිරිවෙනේ වැඩ හිඳිමින් අටුවාකරණයේ නියැලි බුද්ධඝෝෂ හිමියන් විසින් රචනා කරන ලද සමන්තපාසාදිකා ආදී සියලු ම පාලි අටුවාවන් එකල පැවති මහාපච්චරිය අටුවා, කුරුන්දි අටුවා, සංඛේප අටුවා, අන්ධක අටුවා ආදී හෙළටුවා ඇසුරින් රචනා කර තිබීම තුළින් සනාථ වන්නේ දූරසංකර ග්‍රන්ථාකර පිරිවෙනෙහි එම සියලු හෙළටුවා පැවති බවයි. බුදුගොස් හිමියන් විසින් සිය කෘතිවල ආචාර්යවාද, විතණ්ඩ වාද ආදී ථෙරවාදයට අයත් නොවූ වෙනත් මාධ්‍යමික ආදී සම්ප්‍රදායන්ට අයත් මතිමතාන්තර දක්වා තිබීම තුළින් පැහැදිලි වනුයේ ග්‍රන්ථාකර පිරිවෙනෙහි තැන්පත් කොට තිබූ පොත් අතර ත්‍රිපිටකයට හා හෙළටුවාවන්ට පමණක් අයත් නොවූ වෙනත් දර්ශනවාදයන්ට අයත් පොත්පත් ද එහි තැන්පත් කොට තිබූ බවය (රණසිංහ, 2006).

එමෙන්ම මහාවිහාරයේ වංශකථාව ලෙස සලකනු ලබන මහාවංසය රචනා කරන ලද්දේ මහානාම හිමියන් විසිනි. උන්වහන්සේ වැඩවසන ලද්දේ මහාවිහාරයට අයත් ප්‍රධාන මධ්‍යස්ථානයක් වූ

දික්සඳ සෙනෙවි පිරිවෙනෙහි ය. මෙම පිරිවෙන් ආයතනය සතුව පොත්ගුලක් තිබෙන්නට ඇති බවත්, එම පොත්ගුල තුළ ඉතා වටිනා පොත්පත් රාශියක් තිබෙන්නට ඇති බවත් මහාවංසය රචනා කිරීම සඳහා උන්වහන්සේ විසින් ඒවා මූලාශ්‍රය කොට ගන්නට ඇති බවත් විශ්වාස කළ හැකිය. ක්‍රි. ව. පස්වැනි සියවස පමණ කාලය වන විට මහා විහාරය ථෙරවාදී ශාස්ත්‍ර ශාලාවක් බවට පත් වී තිබූ අතර එය කියවීම, ලිවීම, අර්ථකථනය, සජ්ඣායනය හා වාචනා මාර්ගය පදනම් කොටගත් අධ්‍යාපන කටයුතු සිදු කරන අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත්වී තිබුණි. අභිධම්ම මූල ටීකාව රචනා කරන ලද විශ්ව කීර්තිධර භදන්තාචරිය ආනන්ද තෙරණුවෝ ද, රූපසිද්ධිය නම් පාලි ව්‍යාකරණ රචනා කළ චෝළිය බුද්ධප්‍රිය තෙරනුවෝ ද මෙහි වැඩ සිටියහ (පියරතන හිමි, 2006). උන්වහන්සේලා ග්‍රන්ථකරණය සඳහා මූලාශ්‍රය කොට ගත් පොත්පත් හා උන්වහන්සේලා විසින් රචනා කරන ලද පොත්පත් ද තැන්පත් කරන ලද පුස්තකාල ස්වරූපය ගන්නා ලද ආරාම මෙහි තිබෙන්නට ඇති බව විශ්වාස කළ හැකිය. එසේම ක්‍රි.පු. පස්වන සියවසේ දී පමණ මහා මහාවංසයට ටීකාවක් වශයෙන් රචනා කරන ලද වංසත්ථප්පකාසිනිය මහා විහාරික භික්ෂූන් විසින් රචනා කරන ලද ඉතා වටිනා ඓතිහාසික මූලාශ්‍රය ග්‍රන්ථයකි. වංසත්ථප්පකාසිනිය රචනා කිරීමේ දී ඒ සඳහා මූලාශ්‍රය කරගන්නා ලද ග්‍රන්ථ ලෙස සීහළට්ඨකථා මහාවංසය, උත්තර විහාරවංශය, විනයට්ඨකථා, දීපවංශට්ඨකථා, මහාබෝධි වංසට්ඨකථා, සහස්සවත්ථු අට්ඨකථා, චූල සීහනාද සුත්ත වණ්ණනා, සිංහල භාෂා නමස්කාර වණ්ණනා, ගන්ධීපද වණ්ණනා යන ග්‍රන්ථ හඳුනාගත හැකිය (රණසිංහ, 2006). මෙකී ඓතිහාසික තොරතුරු මඟින් පැහැදිලිවනුයේ මහාවිහාරය සතු ඉතා වටිනා උසස් මට්ටමේ පුස්තකාල සංකීර්ණයක් සහිත අධ්‍යාපනික ආයතන තිබූ බවයි.

**අභයගිරිය සම්ප්‍රදාය**

මහාවිහාරයට පසුව මෙරට බිහි වූ ප්‍රධානතම අධ්‍යාපනික ආයතනය අභයගිරිය යි. ක්‍රි.පු. පළවෙනි සියවසේ දී ආරම්භ වූ අභයගිරිය මහායාන ආගමෙහි මෙරට ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස පිළිගැනේ. අභයගිරි විහාරාරාමය ප්‍රධාන අධ්‍යාපන ආයතන කිහිපයකින් සමන්විත විය. කපාරමූළ, වහදුමූළ, උතුරු මූළ සහ

මහනෙත් පාමුළ යන ප්‍රධාන මූලායතන සතර මෙහි වූ ප්‍රමුඛ අධ්‍යාපන ආයතනය වේ. මෙම මූලායතන හතරෙහි භික්ෂූන් වහන්සේලා ඉතා විශාල ප්‍රමාණයක් වැඩ සිටි බවත්, උන්වහන්සේලා ලිවීම, කියවීම, වනපොත් කිරීම ආදී අධ්‍යාපනික කාර්යන්හි නිරත වූ බවත් සඳහන් වේ. අනුරාධපුර යුගයේ පශ්චිම භාගය වන විට මිහින්තලය ද අභයගිරියේ ශාඛාවක් වූ බවත්, එය අභයගිරි ගුරුකුලයට අයත් අධ්‍යාපන මධ්‍යස්ථානයක් ව පැවති බවත්, එහි භික්ෂූන් වහන්සේලා දෙදහසක් පමණ වැඩ සිටි බවත් පාහියන් හිමියන්ගේ සංචාරක වාර්තාවලින් හෙළිවේ (පාහියන් වාර්ථා, පිටු. 116). මහා විහාර පුස්තකාලයට පසුව ඇරඹි අභයගිරි පුස්තකාලය මහායාන ආගමික ග්‍රන්ථ ප්‍රධාන කොටගත් විවිධ විෂයයන්ට අයත් පොත්පත් එකතුවකින් යුක්ත වන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. එමෙන් ම අභයගිරි පුස්තකාල තුළ සංස්කෘත බසින් ලියන ලද වෛද්‍ය, ජෝතිෂ්‍ය, යන්ත්‍ර, මන්ත්‍ර, කලාශිල්ප වැනි ප්‍රායෝගික විෂයන්ට අදාළ පොතපත ද තිබෙන්නට ඇති බව විශ්වාස කළ හැකිය. අභයගිරි විහාරය සතු වූ පුස්තකාල තුළ මහායාන දහමට අදාළ පොත්පත් පමණක් නොව ථෙරවාදයට අයත් කෘතීන් ද තිබෙන්නට ඇත. අභයගිරිය අධ්‍යාපන ආයතනයේ විෂය මාලාවට ථෙරවාදය ඇතුළත් වූ බවත්, ථෙරවාදී ත්‍රිපිටකය එහි අධ්‍යනය කළ බවත් හියුං සියං හිමියන්ගේ සංචාරක වාර්තාවන්හි තොරතුරු සඳහන් වේ (හියුං සියැං හිමියන්ගේ දේශාටන වාර්තා, පිටු. 132). ඒ අනුව ථෙරවාදී ත්‍රිපිටක ග්‍රන්ථ ද එහි පුස්තකාල තුළ තැන්පත් කොට තිබෙන්නට ඇති බවට විශ්වාස කළ හැකි ය. මහායානිකයින්ගේ ත්‍රිපිටකය ද ග්‍රන්ථ සම්භාරයකින් සමන්විත වන අතර එම නිකායට අයත් පෙළ, අටුවා, ටීකා සහිත ත්‍රිපිටක දහම් අඩංගු ග්‍රන්ථ ද බොහෝ වේ. එම සියලු ග්‍රන්ථ තැන්පත් කොට තබන ලද පුස්තකාල හෝ එම ස්වරූපයේ ආරාම අභයගිරි විහාර සංකීර්ණය තුළ තිබෙන්නට ඇති බව නිසැක ය. මහායාන ධර්මයට ප්‍රමුඛස්ථානය දුන් අභයගිරියේ එයට සම්බන්ධ ග්‍රන්ථ රාශියක් තිබෙන්නට ඇති බව ක්‍රි.ව. දාහතර වන සියවසේ විසූ නිකාය සංග්‍රහය කර්තෘ මහායානයට අයත් ග්‍රන්ථ පමණක් නොව ඒවා රචනා කළ ක්‍රම ද දැන සිටීමෙන් වටහා ගත හැකිය. එම යුගයේ දී වෛතුල්‍ය වාදය, වාජිරිය වාදය, රත්නකූට ආදි මහායානයට අයත් ප්‍රභේද මෙරට පැතිරී ගොස් තිබේ (නිකාය සංග්‍රහය, පිටු. 09). මහායානයට අයත් වූ එම ප්‍රභේදයන්ට

අදාළ ග්‍රන්ථ ද මෙරට භාවිත වූ බව ඉන් පැහැදිලි වේ. එම පොත් ද අභයගිරි පුස්තකාල තුළ තැන්පත් කොට තිබෙන්නට ඇත.

අනුරාධපුර රාජධානියේ මධ්‍යතන යුගය වන විට අභයගිරිය ජාත්‍යන්තර ලෙස ප්‍රසිද්ධියට පත්ව තිබී ඇත. එමෙන්ම එම ආරාම තුළ වූ පුස්තකාල පිළිබඳව ජාත්‍යන්තර කීර්තියට හා පිළිගැනීමට ලක් වී තිබී ඇත. මහානාම රජ දවස මෙරටට පැමිණි චීන ජාතික සංචාරක භික්ෂුවක් වූ පාහියන් හිමියන් මෙරටට පැමිණියේ චීනයේ අංගසම්පූර්ණ වූ විනය පිටකයක් සොයාගත නොහැකි වූ නිසා බව පාහියන් හිමියන්ගේ සංචාරක වාර්තාවල සඳහන් වේ (පාහියන් වාර්තා, පිටු. 37). අංග සම්පූර්ණ විනය පිටකයක් සොයා ලංකාවට පැමිණි පාහියන් හිමියන් අභයගිරියේ දෙවසරක කාලයක් නැවතී සිට ඇත. උන්වහන්සේ නැවත සිය රට බලා යන ගමනේ දී ධර්ම ග්‍රන්ථ රැසක් මෙරටින් ගෙන යන ලදහ. එසේ ගෙනගිය පොත් අතර මහිංසාසක විනය පිටකය, දීර්ඝගාම, සංයුත්තගාම, සංයුකත්ත සංඛ්‍ය පිටකය ආදී පොත් පත් වූ බව උන්වහන්සේගේ සංචාරක සටහන් තුළ සඳහන්ව තිබේ. පාහියන් හිමියන් මෙරටට පැමිණ දෙවසරක කාලයක් අභයගිරියෙහි නැවතී සිටීමේ පුවතින් නිසැකව ම පැහැදිලිවනුයේ සංස්කෘත බසින් රචිත එම ග්‍රන්ථ ලබා ගන්නට ඇත්තේ අභයගිරියෙහි පැවති පුස්තකාලවලින් බව ය. එමෙන්ම එම පුස්තකාල තුළ පාහියන් හිමියන් චීනයට රැගෙන ගිය පොත්පත්වල වැඩිපුර පිටපත් තිබෙන්නට ඇති බව හෝ පොත් පිටපත් කිරීමේ පහසුකම් තිබෙන්නට ඇති බව හෝ පැහැදිලිය. මෙම සියලු සාධක මඟින් පැහැදිලිවනුයේ අභයගිරිය මෙරට ප්‍රධාන පෙළේ අධ්‍යාපන ආයතනයක්ව පැවැති බවත්, එහි ප්‍රධාන මූල ආයතනයන් තුළ ප්‍රධාන පුස්තකාල හා කුඩා පුස්තකාල තිබෙන්නට ඇති බවත් ය.

**ජේතවන සම්ප්‍රදාය**

ශ්‍රී ලංකීය ඉතිහාසයේ ඉතා සුවිශේෂී අධ්‍යාපන ආයතනයක් ලෙස ජේතවන පිරිවෙන හඳුනාගත හැකිය. මහාවිහාරයට හා අභයගිරියට පසුව මෙරට ඇරඹි අනෙක් අධ්‍යාපන ආයතනය ජේතවනාරාමය යි. ආගමික මධ්‍යස්ථානයක් හා අධ්‍යාපනික මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වූ ජේතවනය තුළ ඉතා වටිනා පොත්

එකතුවක් සහිතව පුස්තකාලයක් තිබෙන්නට ඇති බවට ජීවමාන වූ සාධක සොයා ගත හැකි ය. මෑත කාලයේ දී සිදුකල පුරාවිද්‍යාත්මක කැණීම් මඟින් ජේතවනාරාම සංකීර්ණයේ ගොඩනැගිලි රැසක පදනම් තහවුරු කරගෙන ඇති අතර ඒවා භික්ෂූන් වහන්සේලාගේ වාසය පිණිස වෙන් කර තිබූ බවත් අනුමාන කරනු ලැබේ. ඒ අනුව ජේතවනාරාමය විශාල ආරාම සංකීර්ණයක් වන්නට ඇති බවත් එහි භික්ෂූන් වහන්සේලා විශාල ප්‍රමාණයක් වැඩ සිටින්නට ඇති බව අනුමාන කළ හැකි ය (රත්නපාල, 1999). අධ්‍යාපන ආයතනයක් ලෙස පැවැති ජේතවනාරාමයේ වැඩසිටින භික්ෂූන් වහන්සේලා විශාල පිරිසකගේ අධ්‍යයනය කටයුතු සඳහා එක්තැන් කොට තබන ලද පොත් හා එහි වැඩසිටි භික්ෂූන් වහන්සේලා විසින් ලියන ලද පොත්පත් හා ලේඛන තැන්පත් කරන ලද පුස්තකාල හෝ එම ස්වරූපය ගන්නා ලද ආරාම තිබෙන්නට ඇති බව සැලකිය හැකිය. ක්‍රි. ව. තුන්වන සියවසේ පමණ ඇරඹි ජේතවනය වෛතුල්‍ය වාදය නොපිළිගෙන අභයගිරිය හැර ගොස් සාගලික වාදය විශ්වාස කළ අවධියේ ඒ පිළිබඳ ලියැවුණු පොත පත ද රැගෙනවිත් ජේතවනයේ පුස්තකාල තුළ නිසැකව ම තැන්පත් කොට තබන්නට ඇත. ජේතවන නිකායට අයත් පඬිවරුන් ථෙරවාදයට හෝ වෛතුල්‍ය වාදයට හෝ සම්බන්ධ නොවී සම්පාදනය කළා වූ ආගමික පොත්වලින් ජේතවන පොත්ගුල් පිරී තිබෙන්නට ඇති බවට සාධක හමුවේ. සාගල තිස්ස හිමියන් ආගම පිළිබඳව ලියූ ව්‍යාඛ්‍යාන සමූහය ද වියත් භික්ෂූන් විසින් ධර්මය ඇතුළු විවිධ විෂයයන් සහ වෙනත් වාදයන් අන්තර්ගත කර රචනා කරනු ලැබූ පොත්පත් ද ජේතවන පුස්තකාලය තුළ තිබෙන්නට ඇති බවට පුරාණ ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය නම් කෘතියේ දී එච්. ආර්. එස්.අයි. රණසිංහ මහත්මිය අදහස් පළ කරයි.

අනුරාධපුර යුගයේ පිරිවෙන් අධ්‍යාපනයත් සමඟ ආරම්භ වූ පිරිවෙන් පුස්තකාල සංකල්පය ඒ ඒ යුගයෙන් යුගයට ක්‍රමානුකූලව සංවර්ධනය වෙමින් පැමිණි නමුත් ඒ ඒ රාජධානිවල ඇතිවූ දේශීය කලකෝලාහල හා විදේශීය ආක්‍රමණයන් හේතුවෙන් ක්‍රම ක්‍රමයෙන් පිරිවෙන් අධ්‍යාපනය මෙන් ම පිරිවෙන් පුස්තකාල සංකල්පය ද පරිහානි තත්ත්වයකට පත් වෙමින් පැවතුණි. මෙහි උච්චතම අවස්ථාව නියෝජනය වන්නේ පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යන විදේශීය ආක්‍රමණිකයන්ගේ ආක්‍රමණයන් ලක් වූ කාල කාලපරිච්ඡේදය තුළ

ය. පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යන විදේශීය ආක්‍රමණිකයන්ගේ පාලනය තුළ බෞද්ධ අධ්‍යාපනය බරපතල වශයෙන් පරිහානියට පත්විය. එහි ප්‍රතිඵලයක් ලෙස බෞද්ධ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූ පිරිවෙන් අධ්‍යාපනයත්, පිරිවෙන් අධ්‍යාපන ක්‍රියාවලියට අවශ්‍ය තොරතුරු සම්පත් සපයන ලද පිරිවෙන් පුස්තකාල සංකල්පයත් ක්‍රමානුකූලව පරිහානිය කරා ගමන් කළේය. ඒ කෙසේ නමුත් දහඅට වන සියවසේ මැද භාගයේ දී සරණංකර සංඝරාජ හිමියන්ගෙන් ආභාෂය ලද උන්වහන්සේගේ ශිෂ්‍ය පරම්පරාව රටේ විවිධ ප්‍රදේශවල ගෙන ගිය ධර්ම ශාස්ත්‍රාලෝකය දහනමවන සියවස පමණ වන විට බෞද්ධ අධ්‍යාපනයටත්, සම්බුද්ධ ශාසනයටත් එල්ල වෙමින් තිබූ අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට සුදුසු පසුබිමක් නිර්මාණය කොට තිබුණි.

## නිගමනය

මේ අනුව පැහැදිලි වන වැදගත් ම කරුණ වන්නේ, පිරිවෙන් අධ්‍යාපනයේ ආරම්භයත් සමඟ ම පිරිවෙන් පුස්තකාල සංකල්පය ආරම්භ වූ බවත්, පිරිවෙන් අධ්‍යාපන ක්‍රියාවලියේ ඵලදායිතාවය සහ ගුණාත්මකභාවය ඇතිකර ගැනීමට පිරිවෙන් පුස්තකාල බෙහෙවින් උපකාරී වූ බවත් ය. පිරිවෙන් අධ්‍යාපනය හා පිරිවෙන් පුස්තකාල සංකල්පය වෙන්කොට හඳුනාගත නො හැකි අන්‍යෝන්‍ය වශයෙන් එකට බැඳී ක්‍රියාත්මක වන අවියෝජනීය සංකල්ප දෙකක් බව ඒ ඒ යුගයන් පිළිබඳ ව අධ්‍යනය යොමු කිරීමෙන් මනාව ප්‍රත්‍යක්ෂ කරගත හැකිය. පිරිවෙන් අධ්‍යාපනය සඳහා අවශ්‍ය පොත්පත් ඇතුළු තොරතුරු මූලාශ්‍රයන් සපයා දීමෙන් පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථයන් සඵල කර කර ගැනීමට පිරිවෙන් පුස්තකාලවලින් ලද දායකත්වය අතීතයේ සිට අනූපමේය ය. අනුරාධපුරය යුගයේ සිට මහනුවර යුගය දක්වා ඒ ඒ යුගවල පිරිවෙන් අධ්‍යාපනයේ නැගීමත් බැසීමත් පිරිවෙන් පුස්තකාල වල නැගීමත් බැසීමත් එකම අයුරින් සිදු වූ බව මනාව පැහැදිලි කර ගත හැකිය. ඒ අනුව ඒ ඒ යුගයන් වල පිරිවෙන් අධ්‍යාපනයට පිරිවෙන් පුස්තකාලය ලබාදුන් දායකත්වය තුළින් පිරිවෙන් පුස්තකාල සංකල්පයේ වැදගත්කම මනාවට පැහැදිලි වනු නොඅනුමාන ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අධිකාරම්, ඊ.ඩබ්ලිව්. (1963), *පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය*, කොළඹ: කේ.කේ.ජී. ජයවර්ධන සහ සමාගම

ධර්මකීර්ති හිමි, නිවන්දම. (1992), *ලක්දිව බුදු සසුන හා මහ සඟ පරපුර*, කොළඹ ගොඩගේ

*නිකාය සංග්‍රහය*, (1907), සංස්කරණය, සයිමන් ද සිල්වා, ඒ. මැන්දිස් ගුණසේකර සහ ඩබ්ලිව්. ගුණවර්ධන, කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය

ෆයිරුස්, එම්. බී. එම්. (2001), *පැරණි ලංකාවේ පොත්ගුල්*, කෞතුකාගාර සඟරාව, කොළඹ

සන්නස්ගල, පී.බී. (1994), *සිංහල සාහිත්‍ය වංශය*, කොළඹ: සංස්කෘතික දෙපාර්තුමේන්තුව

*සාරත්ථදීපනී*, (1914), සංස්කරණය, දෙවරක්ඛිත හිමි, කොළඹ

පරණවිතාන, සෙනෙරත්. (1964), මහාවිහාරය හා වෙනත් පැරණි විද්‍යා පීඨ, *අධ්‍යාපනයේ සියවස*, කොළඹ: අධ්‍යාපන අමාත්‍යංශය

පඤ්ඤාකර හිමි, නාත්තන්ඩියේ (1967), *පුරාණ ලංකාවේ පොත්ගුල් හා ඒවා ආරක්ෂාවට භික්ෂූන්ගෙන් සිදු වූ සේවය*, Ceylon Library review, Colombo: Journal of the Ceylon Library Association

පියරතන හිමි, ලැගුම්දෙනියේ (2008-2009), පොළොන්නරුවේ ආරාමික විහාරස්ථාන වල පොත් එකතුව පිළිබඳ විමර්ශනයක්, *පුස්තකාලය විද්‍යා*, කැලණිය: පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය

ලගමුව, ආරිය (2006), *ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව*, බත්තරමුල්ල: කර්තෘ

වික්‍රමනායක, අබේසිංහ ( 1999), *පැරණි ලංකාවේ ආරාම අධ්‍යාපනය*, නුගේගොඩ: කර්තෘ